සියලු ම හිමිකම් ඇවිරිණි/All Right Reserved / முழுப் பதிப்புரிமையுடையது

# ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය
# இலங்கை அபிவிருத்தி நிருவாக நிறுவகம்
# SRI LANKA INSTITUTE OF DEVELOPMENT ADMINISTRATION

## ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2020(I)

කාලය: පැය 03

පරිපාලනය - (02-I)

විභාග අංකය
Index No / சுட்டெண்
.......................................

- **ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

---

01. සෑම රාජ්‍ය ආයතනයකම පුරවැසි ප්‍රඥප්තියක් ප්‍රදර්ශනය කිරීමේ වැදගත්කම මේ වන විට ද චක්‍රලේඛ මගින් තහවුරු කර තිබේ. සෑම රාජ්‍ය ආයතනයකටම අනන්‍ය වන වෙබ් අඩවියක් පැවතීම ද කාලීන අවශ්‍යතාවකි.

අ. (i) පුරවැසි ප්‍රඥප්තියකින් අදාළ රාජ්‍ය ආයතනයට ඇති ප්‍රයෝජන පහක් (05) හඳුන්වන්න. (ලකුණු 05)

(ii) පුරවැසි ප්‍රඥප්තියක් නිසා පුරවැසියෙකුට සැලසෙන වාසි පහක් (05) ලියන්න. (ලකුණු 05)

ආ. පුරවැසි ප්‍රඥප්තියක අන්තර්ගතය කෙරෙහි ද අවධානය යොමු කරමින් රාජ්‍ය ආයතනයක් සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු පහක් (05) පැහැදිලි කරන්න. (ලකුණු 10)

(මුළු ලකුණු 20)

02. ඔබ සේවය කරන රාජ්‍ය ආයතනයේ සේවා සම්පාදනය පිළිබඳ අතෘප්තියට පත් වූ සේවා ලාභියෙකු ඒ ගැන දොස් පවරා ඔබ ආයතනයේ පොදු විද්‍යුත් ලිපිනයට ලිඛිතව කරුණු ඉදිරිපත් කර ඇත. මේ පිළිබඳව සොයා බැලීමේ දී සේවා ලාභියා සඳහන් කර ඇති කරුණුවල සත්‍යතාවක් ඇති බව ඔබට තහවුරු වෙයි.

සුදුසු ආයතනයක් නිදර්ශන වශයෙන් සලකා ප්‍රායෝගිකව සිදු විය හැකි උපකල්පිත ප්‍රමාද දෝෂයක් අවධානයට ගනිමින් සේවා ලාභියාට යැවිය යුතු පිළිතුරු විද්‍යුත් ලිපිය (e-mail) කෙටුම්පත් කරන්න. (ලකුණු 20)

03. අ. ජනමාධ්‍ය වෙත තොරතුරු සැපයීමේ දී රාජ්‍ය ආයතනයක් අනුගමනය කළ යුතු පොදු විධි විධාන විස්තර කරන්න. (ලකුණු 08)

ආ. මූලික විමර්ශනයක් හා විධිමත් විනය පරීක්ෂණයක් අතර වෙනස්කම් සංසන්දනය කරන්න. (ලකුණු 12)

04. රාජ්‍ය සේවයට බඳවා ගැනීමේ පටිපාටියක අන්තර්ගත විය යුතු මූලික කරුණු සාකච්ඡා කරන්න. (ලකුණු 20)

05. අ. "රාජ්‍ය නිලධරයකුට නිවාඩු යනු අයිතිවාසිකමක් නොව වරප්‍රසාදයකි." මෙම ප්‍රකාශය සාධාරණීකරණය කරන්න. (ලකුණු 10)

ආ. "රාජ්‍ය නිලධරයකුට නිවාඩු යනු වරප්‍රසාදයක් වුව ද එය අත්‍යවශ්‍ය වේ." මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 10)

06. කාර්ය පටිපාටික රීති අවධානයට ගනිමින් පහත දැක්වෙන මාතෘකාවන්ට අදාළව කෙටි සටහන් ලියන්න.

i. සක්‍රීය සේවා කාලය
ii. සේවා ව්‍යවස්ථාව
iii. සේවා අවශ්‍යතා මත ස්ථාන මාරු
iv. පත්වීම අවසන් කිරීම

(ලකුණු 5x4=20)

*************